# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව

செயலகம், கொழும்பு 01.
இலங்கை

The Secretariat, Colombo 01.
Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: (+94)-11-2449823

කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458

වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No. BD/CBP/4/1/2/2018

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2017.07.25

ජාතික අයවැය දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

***ජාතික අයවැය චක්‍රලේඛ අංක 2/2017***

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**<u>අයවැය කැඳවීම - 2018</u>**
**<u>වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ හා උපදේශ</u>**

දැනට ක්‍රියාත්මක මූලධන ව්‍යාපෘති හා නව ආයෝජන සඳහා පහසුකම් සැලසීමට හා කඩිනම් කිරීමට මෙන්ම සංවර්ධන ප්‍රමුඛතා මත සම්පත් වෙන් කිරීම යතානුරූපීව පවත්වා ගෙන යාම සඳහා 2017.07.14 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුවට අනුකූලවන පරිදි 2018 වර්ෂය සඳහා අයවැය සකස් කිරීම සිදුකරනු ලැබේ.

අයවැය ක්‍රියාවලියට මධ්‍ය කාලීන දැක්මක් හඳුන්වාදීම මගින් එය වඩා උපායමාර්ගික හා රජයේ ප්‍රමුඛතාවන්ට අනුකූලවන ක්‍රියාවලියක් බවට පත්වේ. ඒ අනුව, රාජ්‍ය මූල්‍ය ප්‍රමුඛතා අනුව සැකසූ මධ්‍ය කාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව හා ඇස්තමේන්තුගත සම්පත් සමඟ අයවැය ක්‍රියාවලිය සම්බන්ධ කළ හැකි අතර එමගින් අයවැය ක්‍රියාත්මක කිරීමේදී මූල්‍ය විනය ශක්තිමත් කිරීමට මෙන්ම රජයේ ප්‍රතිපත්ති හා ප්‍රමුඛතා සමඟ අයවැය වෙන් කිරීම් හා වියදම් පෙළ ගැස්වීමට හැකිවේ.

මේ අතර අයවැය පිළියෙල කිරීමේ පුළුල් දැක්මට ඇතුලත් වන අවශ්‍යතාවයන් වනුයේ 2030 වන විට තිරසාර සංවර්ධන අරමුණු (Sustainable Development Goals) ලඟා කර ගැනීම දෙසට ගමන් කිරීමයි. (වර්ෂ 2015 එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින් එකඟවූ තිරසාර සංවර්ධන අරමුණු ලැයිස්තුව **ඇමුණුම් 1** හි දක්වා ඇත.)